# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2195/7 - 2020 සැප්තැම්බර් මස 28 වැනි සඳුදා - 2020.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/HAR/4/2/1/47.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/09/2015/WS/149.

මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ උඩුවාවල සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ 417 උඩුවාවල බටහිර ග්‍රාම නිලධාරි වසමේ උඩුවාවල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක 320320 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 02හි පත්‍ර අංක 01හි කැබලි අංක 103 ලෙස දැක්වෙන හෙක්ටයාර් 0.0481ක් පමණ වූ ඉඩම් කැබැල්ල :

1. **කැබලි අංක 103**

ඉඩමේ නම: -; හිමිකම් කියන අය: පී. බී. ජී. චාර්ලිස්, 24, ගොතටුවේවත්ත, උඩුවාවල, කටුගස්තොට, ජේ. ඒ. විමලසේන, 24/ඒ, ගොතටුවේවත්ත, උඩුවාවල, කටුගස්තොට, ජේ. ඒ. හින්නි අප්පුහාමි, 24/එෆ්, ගොතටුවේවත්ත, උඩුවාවල, කටුගස්තොට, ඒ. රාජපක්ෂ, 23, නාගස්පිටියහන්දිය, උඩුවාවල, කටුගස්තොට, නන්දා ජයකොඩි, 24/එෆ්, ගොතටුවේවත්ත, උඩුවාවල, කටුගස්තොට, මහින්ද රාජපක්ෂ, ගලහිටියාවත්ත, උඩුවාවල, කටුගස්තොට, ඒ. පූජිත ගුණවර්ධන, 24/3, උස්කැටේවත්ත, උඩුවාවල, කටුගස්තොට, ඉන්ද්‍රානි ශ්‍රියාලතා පොල්ගස්පිටිය, 24/5, උස්කැටේවත්ත, උඩුවාවල, කටුගස්තොට, පී. බී. ජී. ජේම්ස්, 24/සී, උස්කැටේවත්ත, උඩුවාවල, කටුගස්තොට, විපුල බස්නායක, උස්කැටේවත්ත, 24/1, මංගල, උඩුවාවල, කටුගස්තොට; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0481.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 04 වැනි දින පෙ.ව. 10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2020, නොවැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, වෙන පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

මොහාන් ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 461

1A - G 33007 – 55 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AKU/LAN/06/LA49.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/99/එච්.ඩබ්./47ඒ.

2009 මැයි මස 21 වැනි දින අංක 1602/17 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ* 7 ඒ පිටුවේ 7 වෙනි වගන්තිය යටතේ මා විසින් දැනුම් දී ඇති සර්වේයර් ජනරාල්ගේ අවසාන ගම් පිඹුරේ අතිරේක අංක 45හි කැබලි අංක 418 වශයෙන් පෙන්නුම් කර ඇති ඉඩමෙහි නම "අඹේතොටවත්ත" වශයෙන් යන්න "කාපියන්ගොඩවත්ත හෙවත් අඹේතොටඹිටිටවත්ත" වශයෙන් සංශෝධනය කළ බව මෙයින් දැනුම් දෙමි. වැඩි විස්තර 2009.05.21 වැනි දින අංක 1602/17 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් වේ.

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 462

---

ශුද්ධිපත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVPANN/LND/ACDEP/1/4/11.

2020 මාර්තු මස 06 වැනි දිනැති අංක 2165/69 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමේ ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ "2020 මැයි මස 06 වැනි දින පෙ.ව. 10.00" යනුවෙන් සඳහන් වී ඇතත් එය "**2020 ඔක්තෝබර් මස 28 වැනි දින**" යනුවෙන් සඳහන් විය යුතුය.

ඉහත දැන්වීමේ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් "2020 අප්‍රේල් මස 29" වැනි දිනට මත්තෙන් දැනුම් දිය යුතු බව සඳහන් වූවත් එය **"2020 ඔක්තෝබර් මස 21"** දින යනුවෙන් සඳහන් විය යුතුය.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2020 සැප්තැම්බර් මස 18 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 463

---

ශුද්ධිපත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීම

*මගේ අංකය* : 4/1/1/32/J.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තිය යටතේ මා විසින් අංක 2152/67 හා 2019.12.06 දින පළ කරන ලද දැන්වීමේ අංක 2A පිටුවේ අනු අංක 15 යටතේ පළකර ඇති මූලික පිඹුරු අංක කු. 2434 කැබලි අංක 15හි පමණක් පහත දක්වා ඇති පරිදි සංශෝධනය විය යුතු බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

**'1. කැබලි අංක 15**

ඉඩමේ නම: පල්කඩපුරන් කුඹුර; ඉඩම් පරිහරණය: සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් සහිත ගෙවත්ත; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. පී. ඕ. එල්. ජේ. පතිරණ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0589.'

ටී. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල.

2020 සැප්තැම්බර් මස 21 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 465

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.